# භික්ෂුවගේ සමාජ කාර්යභාරය

ඇතාකඩ ධම්මධජ හිමි[1]

## හැඳින්වීම

භික්ෂූන් වහන්සේ යනු වර්තමාන සමාජයේ විවිධ අභියෝගවලට මුහුණපාන චරිතයකි. භික්ෂුවකගේ මූලික අනන්‍යතාවන් විනාශ කරමින් කවර හෝ සමාජ කටයුත්තකට සහභාගි වීම භික්ෂූන් වහන්සේගෙන් බලාපොරොත්තු විය යුත්තක් නොවේ. භික්ෂුව යනු සීමා සහිත පුද්ගලයෙකි. එකී සීමාවන් අභිභවා යෑම භික්ෂුවට කිසිසේත් උචිත නොවේ. යම් භික්ෂුවක් තමාගේ සීමාවන් හා අනන්‍යතාවන් ගැන අවබෝධයකින් කටයුතු කරන්නේ නම් සැමදා ඔහු සමාජ කාර්යයන්හි දී පූජනීයත්වයෙන් සැලකෙයි.

## පර්යේෂණ ක්‍රමවේදය

ත්‍රිපිටකාගත සූත්‍ර මෙහිදී මූලික වශයෙන් ආශ්‍රය කරන ලදි. ඊට අමතරව ශාස්ත්‍රීය ලිපි, පුවත්පත් හා සඟරා ආදියද මූලාශ්‍ර වශයෙන් භාවිතයට ගන්නා ලදි.

## පර්යේෂණ ගැටලුව

'වර්තමාන සමාජය සඳහා භික්ෂුවගේ සමාජ කාර්යභාරය කෙසේ විය යුතුද' යන්න මෙහිදී සාකච්ඡා කෙරේ.

## දත්ත විශ්ලේෂණය

භාරතීය සමාජයේදී බ්‍රාහ්මණ ධර්මය ඉස්මතු වීමත් සමග පූජකත්වයට ප්‍රමුඛ ස්ථානයක් ලැබුණි. භාරතීය සමාජය තුළ විවිධ ශ්‍රමණ සම්ප්‍රදායයන් පැවතියත් බුදුරදුන් ඇරඹූ පැවිදි සම්ප්‍රදාය සුවිශේෂී වූයේ එය හුදෙක්ම ආධ්‍යාත්මික ප්‍රයත්නයක් ලෙස ක්‍රියාත්මක වූ හෙයිනි. එම ආධ්‍යාත්මික ප්‍රයත්නයේ ජීවමාන සාක්ෂ්‍යය සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේය. එම චින්තන ධාරාව මූලික වශයෙන්ම සැකසුණේ භික්ෂු - භික්ෂුණී, උපාසක - උපාසිකා යන සිව් පිරිසෙනි. බුදුසමය අනෙක් ආගම් හා දර්ශනයන් ඉක්මවා ඉදිරියට ගියේ එය විශේෂයෙන්ම මානව හිතවාදී වූ හෙයිනි.

ලෞකික කාම වස්තූන්ගේ ඇලී ගැලී වාසය කරන මිනිසුන්ට විරාගය පිණිස උතුම් දහම් දෙසීම අතිශය දුෂ්කර කාර්යයකි. එවැනි පුද්ගලයන්ගේ

[1] උපාධි අපේක්ෂක, බෞද්ධ අධ්‍යයන පීඨය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, dhammadhajathero@gmail.com

මානසික ස්වභාවයන්ට උචිත අයුරින් දහම් දෙසීම නිසා ශ්‍රාවකයා තුළ ක්‍රමානුකූල මානසික වර්ධනයක් සිදුවිය. කාමභෝගී ගිහියන් පවා අර්හත්වයට පත් වූයේ ඒ නිසාය. මෙසේ සමාජයෙන් වෙන් වී වනගත තවුස් ක්‍රමයකට සීමා වී තිබූ ආගමික ජීවිතය සමාජ ජීවිතය හා එක් කළ ආගමික දර්ශනයක් බිහි වූයේ බුදුන්වහන්සේ අතිනි. වනගත තවුස් දිවිය සමාජගත පැවිදි දිවියක් බවට පත්කිරීමත්, සමාජගත පුද්ගලයාට තෘප්තිමත්භාවයකින් යුක්තව ආගමික වත් පිළිවෙත් කරන්නට අවස්ථාව උදාකර දීමත් හේතුවෙන් අදටත් ගිහි පැවිදි දෙපිරිස අතර අන්‍යොන්‍ය බැඳීමක් පවතින බව නොරහසකි.

භික්ෂුවගේ සමාජ කාර්යභාරය පහදාගැනීමට පෙර භික්ෂූන් වහන්සේගේ සැබෑ අනන්‍යතාව සුරක්ෂා වන්නේ කුමන ආකාරයේ ගිහි ප්‍රජාවක් තුළද යන්න විමසිය යුතු කරුණකි. යම් පුද්ගලයෙකු උපාසක ගුණයෙන් යුක්ත නම් බෞද්ධයා වන්නේ ඔහුය. සද්ධා, සීල, සුත, චාග, පඤ්ඤා යනු ඒ උපාසක ගුණයෝය.

ශ්‍රද්ධාව නම් තථාගතයන් වහන්සේගේ අවබෝධය තමාටද ලෝ තතු අවබෝධ කිරීම සඳහා ප්‍රමාණත්වයෙන් ගැනීමයි. බුද්ධ ප්‍රසාදය වන්නේ ධර්ම ප්‍රසාදය පාදක කොටගෙන බව එමගින් පැහැදිලි වේ. එනම් ධර්ම ප්‍රසාදය නිසා එම සත්‍ය ප්‍රකාශ කරන ශාස්තෘන් වහන්සේ පිළිබඳ ප්‍රසාදය ඇතිවෙයි. "සත්ථරි පසිදති" යනුවෙන් සඳහන් වන්නේ මෙයයි. සාසන ප්‍රතිපදාවට පිවිසීම සඳහා ශාස්තෘන් වහන්සේ විසින් දේශිත ධර්මය ජීවමාන වශයෙන් පිළිබිඹු වන තැනක් සාමාන්‍ය පුද්ගලයාට අවශ්‍යය. සාමාන්‍ය ජනතාවට ධර්මදේශනා කිරීමේදී ආනුපුබ්බී කතාවලින් අනතුරුව සාමුක්කංසික දේශනා පවත්වන්නේ එනිසාය. සංසාරය, කර්මය නොදත් සාමාන්‍ය ජනතාවට දහම් මගට බැසීමට පහසුව සැලසෙන්නේ සංසරත්නය විද්‍යමාන නම් පමණක් බවද සිහිතබාගත යුතුමය. මෙම ක්‍රියාවෙහිදී ශ්‍රද්ධාව මූලිකත්වයක් ගනී. ශ්‍රද්ධාව සමගම සංයෝග වන අනෙක් අංගය ශීලයයි. එනම් පංචශීල ප්‍රතිපදාවයි.

"සුත" යනුවෙන් හඳුන්වන්නේ අනෙක් අංගයයි. බුද්ධ වචනයට මනාව සවන්දීමෙන් ලබාගන්නා මනා දැනීමක් ඇති බව එයින් කියවේ. ස්වාක්ඛාතාදි ධර්මය ඇසීමෙන් ලබන බහුශ්‍රැතභාවය එයයි. සිව්වැනි අංගය "චාග" නම් වේ. එනම් අනෙකාගේ ජීවන අවශ්‍යතාවන් දැක හැකියාවක් තිබේ නම් ඉටුකර දීමය.

අවසන් කරුණ වන්නේ "පඤ්ඤා" යන්නය. මෙමගින් බුදුන් වහන්සේ අර්ථවත් කරනුයේ "උයදත්ථගාමිනි පඤ්ඤා" යන්නය. එනම්, නිර්මාණවාදිව හෝ අහේතුකවාදීව නොගෙන අනිත්‍ය වශයෙන් ගැනීමය.

භික්ෂුවකගේ මූලික සමාජ කාර්යය වන්නේ මෙම ගුණ ගිහියන් තුළ වර්ධනය වන ආකාරයෙන් ක්‍රියා කිරීමය. එම කාර්ය සාර්ථක වීමට නම් භික්ෂුව

තුළද එකී ගුණයන් මනාව සංවර්ධනය වී තිබිය යුතුය. ධර්ම සන්නිවේදනය මැනවින් සිදුවන්නේ එවිටය. මෙය වර්තමානයේදී සංකීර්ණ ගැටලුවක් වී ඇත. ළමා වයසේදී පැවිදි බිමට පිවිසෙන භික්ෂූන් පසු කාලයේදී හෝ උක්ත ගුණයන් ප්‍රගුණ නොකළේ නම් ගිහි ජනතාව ඉහත කී උපාසක ගුණවලින් සම්පූර්ණ කිරීමට භික්ෂූන් වහන්සේ අසමත් වෙති. කෙසේ වෙතත් වර්තමාන සමාජය තුළ භික්ෂුවට සම්බන්ධ වීමට ඇති ගිහි සමාජය වැඩි වශයෙන් බෞද්ධකම සංස්කෘතික දායාදයක් වශයෙන් පමණක් භාරගත් නිසා ලජ්ජා භය සහිත ශික්ෂා ගරුක භික්ෂුවකට තම පැවිදි අනන්‍යතාව රැකගැනීම සැබවින්ම අසීරු කරුණක් වී තිබේ.

එසේම යම් භික්ෂුවක් ප්‍රඥාවෙන් තොරව සමාජ කාර්යන්හි නිරත වන්නේ නම් භික්ෂු අනන්‍යතාව බිඳවැටෙන ක්‍රියා රටාවන්ට හසුවීම සාමාන්‍ය කරුණකි. භික්ෂුවකගේ සැබෑ කාර්යභාරය විය යුත්තේ කුමන හෝ සමාජයක නියමුවන් බවට පත්වීම ම නොවේ. සමාජගත පුද්ගලයාට සමාජය තුළ ක්‍රියාත්මක වීමේදී තිබිය යුතු යහපත් ආකල්පයන් කවරේදැයි විමසා බැලීම සඳහා භික්ෂූන් වහන්සේ ගිහියාට වඩා වැඩි අවස්ථාවන් හා විවේකයක් ලබති. ඒ විවේකයෙන් අවශ්‍ය සමාජ උපදේශනය ජනතාවටත් රාජ්‍ය තන්ත්‍රයටත් ලබාදීම භික්ෂුවගේ සමාජ කාර්ය විය යුතුය. භික්ෂුවකගේ විවේකය යනු මදයෙන් හා ප්‍රමාදයෙන් වෙන්වීමය. ඉවසීමෙහි හා කායික වාචසික සුචරිතයන්ගෙන් යුක්ත අයෙකු විය යුතුය. ඉන්ද්‍රිය දමනයේ හා ක්ලේශ පරිනිර්වාණයේ උත්සාහවත් භික්ෂුවක්ම සමාජ කාර්යයෙහි නිරත විය යුතුය.

## නිගමනය

මෙවන් ගුණයන්ගෙන් යුත් භික්ෂූන් වහන්සේ කුමන ආකාරයේ සමාජ කාර්යයක් ඉටුකළ යුතුද යන්න චක්කවත්ති සූත්‍රය පෙන්වා දෙයි. රජු කලින් කල පැමිණ දක්ෂතාව කුමක්ද (කිං භන්තේ කුසලං) අදක්ෂතාව කුමක්ද (කිං අකුසලං) වැරැද්ද කුමක්ද (කිං සාවජ්ජං) නිවැරැද්ද කුමක්ද (කිං අනවජ්ජං) ඇසුරුකළ යුත්තේ කුමක්ද (කිං සෙවිතබ්බං) කුමක් කළහොත් දිගු කලක් අවැඩ පිණිස පවතීද (කිං මෙ කරියමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය අස්ස) කුමක් කළහොත් දිගු කලක් වැඩ පිණිස පවතීද (කිං වා පන මෙ කරියමානං දීඝරත්තං හිතාය සුඛාය අස්ස) යනුවෙන් ප්‍රශ්න කරන විට මනාව එම ප්‍රශ්න විසඳාලීමට අවශ්‍ය විචක්ෂණ බුද්ධිය භික්ෂුව සතු විය යුතුය. සාමාන්‍ය ගිහියන් මෙන් රැල්ලට නොගොස් සමාජ කාර්යන්හි නියුක්ත වීමට භික්ෂූන් වහන්සේට හැකිවන්නේ එවිටය.

වර්තමානයේදී මෙම සමාජ අවශ්‍යතාවන් පිරිමසාලීමට අවශ්‍ය විචාර බුද්ධිය භික්ෂුව වෙතින් පලාගොස් ඇත්තේ බෞද්ධකම තමන්ට හිමි සංස්කෘතික

දායාදයක් යැයි සිතන හෙයිනි. භික්ෂුත්වය යනු ප්‍රතිපදාවට පිවිසීමය. එසේ නොමැතිව පැවිදි වෙසින් සිටීම ගිහි භෝගයෙන් පිරිහීමකි. ශ්‍රමණ ධර්මයන් නොපුරයි නම් එය අපවිත්‍ර ජීවන රටාවක් බව සංයුත්ත නිකායේ පිණ්ඩෝල සූත්‍රයෙහි දක්වේ. යම් සේ දෙකෙළවර ගිනිගත් මැද අසූචියෙන් තැවරුණු දර කැබැල්ලක් වනයෙහි හෝ ගමෙහි හෝ දර ගොඩකට එකතු නොවේද එපරිද්දෙන් අන් සතු වස්තුවට දැඩි සේ ආශා කරන (අභිජ්ඣාලු කාමෙසු තිබ්බසාරාගො) අනුන් නසන දුෂ්ට සිතින් ක්‍රියා කරන (අබ්‍යාපන්න චිත්තෝ පදුට්ඨ මන සංකප්පො) එළැඹි සිහියෙන් ක්‍රියා නොකරන (මුට්ඨස්සති) සම්පජානයෙන් තොර වූ (අසම්පජානො) ලෝකය ඇති සැටියෙන් කල්පනා නොකරන (විභන්ත චිත්තො) නොවැඩූ ඉන්ද්‍රියන් ඇති (පාකතින්ද්‍රියො) භික්ෂුවද ගිහි පැවිදි දෙපසින්ම අපිරිසිදු වූ පුද්ගලයෙකු බව දක්වේ. භික්ෂුවක් මෙම දුර්වලතාවන් මුලදීම සකස්කරගත යුතුය. එසේම භික්ෂුව සමාජ කාර්යයෙහි නියුක්ත විය යුත්තේ උක්ත ගුණයන් විනාශ නොවන ආකාරයෙනි.

ප්‍රමුඛ පදඃ භික්ෂුව, සමාජය, සමාජ ප්‍රශ්න, සමාජ අවශ්‍යතා, උපදේශනය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*අංගුත්තරනිකාය.* (2006). බු.ජ.ත්‍රි.

*දීඝනිකාය.* (2006). බු.ජ.ත්‍රි.

*මහාවග්ගපාල.* (2006). බු.ජ.ත්‍රි.

*මජ්ඣිමනිකාය 1,* (2006). බු.ජ.ත්‍රි.